*සැ. යු.* - 2024.03.28 වැනි දින පළ වූ අංක 2378 *ගැසට් පත්‍රයේ VI* කොටසේ ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ ලියාපදිංචි පශු වෛද්‍යවරුන්ගේ හා වෘත්තිකයන්ගේ නාමාවලියේ ලියාපදිංචි දිනය 2020.07.20 ලෙස සඳහන් වී ඇත. එය 2024.03.01 ලෙස නිවැරදි විය යුතුය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,380 - 2024 අප්‍රේල් මස 10 වැනි බදාදා - 2024.04.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 128 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 129 |

*සැ. යු.*- අල් ෆලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2024 මාර්තු මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 මැයි මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මාරවිල දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

නඩු අංකය : 367MB
ඇස්කීසි අංකය : 16/2024

................*පැමිණිලිකරු.*

*එදිරිව*

ගජසිංහගේ මංජු ප්‍රදීප් කුමාර් සිල්වා මයා,
පහළ වලහපිටිය, නාත්තන්ඩිය.

.......................*විත්තිකරු.*

මාරවිල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2020.10.08 වන දින ප්‍රකාශයට පත්කරන ලද සමථ තීන්දුව ප්‍රකාරව 367/MB දරන නඩුව සඳහා ඉහත නම් සඳහන් විත්තිකරු එකඟ වූ රු. 1,891,736.16 ක මුදල ගෙවීම පැහැර හැර විත්තිකරු සමථය කඩකර ඇති බැවින් එකී සමථය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ දැක්වෙන පරිදි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයවිය යුතු පළමු නඩු නිමිත්ත මත 2019.09.01 දිනට රු.863,854.77 ක මුදලක් සහ රු. 846,203.96 ක මුදල මත 2019.09.01 දින සිට 14%ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොළියක් ද, දෙවන නඩු නිමිත්ත මත 2019.08.04 දිනට රු. 380,393.33 ක මුදලක් සහ රු. 361,111.20 ක මුදල මත 2019.08.04 දින සිට එකී මුදලට 19% ක වාර්ෂික පොළී අනුපාතිකය මත සම්පූර්ණ මුදල ගෙවනු ලබන දින දක්වා පොළියක් ද, සහ වෙන්දේසි ගාස්තු අයකර ගැනීම සඳහා මෙම අධිකරණය මගින් නිකුත් කර ඇති ඇස්කීසි ආඥාව ප්‍රකාරව තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළෙහි එම විත්තිකරුවන්ට අයත් සියලුම හිමිකම් හා අයිතිවාසිකම් ,

**වර්ෂ 2024 ක් මැයි මස 10 දින පෙ.ව. 11.00 ට,**

දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව සියල්ලන්ටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

*ඉඩමට පිවිසීම.-* මහවැව මහජන බැංකු ශාඛා පරිශ්‍රයේ සිට මාරවිල දෙසට කි. මී. 3 ක් පමණ ගමන් කළ පසු තල්විල හන්දියෙන් වම්පසට ඇති හාල්පන්විල පෙදෙසට ඇති පාරේ කි. මී. 2.5ක් පමණ ගමන් කළ පසුව වම් පස ඇති ශ්‍රීන්ෆාම් ආයතනය හමුවේ. එය පසුකර ඉදිරියට කි. මී. 1/2 ක් පමණ ගමන් කළ පසුව හමු වන දකුණට ඇති තාර පාරේ (සර්වෝදය බැංකුව ඉදිරිපිට) මීටර් 50 ක් පමණ ඉදිරියට ගමන් කළ පසුව හමුවන දකුණට ඇති වැලි පාරේ කෙළවරට පිහිටි නිවස සහිත ඉඩම වෙන්දේසි කිරීමට නියමිත දේපළ වේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත්, දකුණු පිටිගල් කෝරළේ, යටකලන් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පුහුල්හේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත්, පහළ වලහපිටිය නැමති ගමේ පිහිටි, මකුල්ලගහවත්ත නමැති ඉඩමට, එම්. ඩී. ප්‍රනාන්දු බලයලත් මානකතැන විසින් 1973.07.15 වැනි දින මැන සාදන ලද අංක 2834 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 10 දරන ඉඩමට මායිම් : උතුරට : ලොට් අංක 7B දරන කොටස ද, නැගෙනහිරට : ලොට් අංක 09 දරන කොටස ද, දකුණට : එම්. එම්. කැතරීන්ට අයිති ඉඩම ද, බස්නාහිරට : එම්. මාරසිංහගේ ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම හතරක් (රූඩ්. 01, පර්. 24.4) විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 185/52 හි ලියාපදිංචි වී ඇත.

ඉහත කී ඉඩම පහත පරිදි නැවත මැන සාදා ඇත.

ඉහත කී නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, පුහුල්හේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත්, පහල වලහපිටිය නැමති ගමේ පිහිටි, මකුල්ලගහවත්ත නමැති ඉඩමට, එම්. ජේ. ගෝමස් බලයලත් මානක තැන

විසින් 1999.02.05 වැනි දින මැන සාදන ලද අංක 3444 දරන පිඹුර ප්‍රකාර එකී ඉඩමට මායිම් : උතුරු නැගෙනහිරට : අංක 2834 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 7B දරන අඩි 12 ක් පළල පාර ද, නැගෙනහිරට : අංක 2834 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 09 දරන කොටස ද, දකුණට : එම්. එම්. කැතරින්ට අයිති ඉඩම ද, බස්නාහිරට පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම හතර (රූඩ් 01 පර්. 24.4) ක් *හෙවත්* හෙක්ටයාර් බින්දුවයි දශම එකයි හයයි දෙකයි නවය (හෙක්. 0.1629) ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමඟ වේ.

ඉහත කී ඉඩමට ප්‍රවේශ වීමට ඇති බස්නාහිර මායිමෙන් දක්වා ඇති පාර සහ උතුරු මායිමින් දක්වා ඇති අඩි 12ක් පළල පාර පොදුවේ පාරක් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග අයිතිය ද සමඟ වේ.

ඉඩමේ ප්‍රමාණය : රූඩ් 01 පර්චස්. 24.4

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 185/52 හි ලියාපදිංචි වී ඇත.

එස්. එම්. වික්‍රමනායක ආරච්චි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
මාරවිල.

2024 ක් වූ මාර්තු මස 15 වැනි දින දී ය.

04-169

---

## විවිධ දැන්වීම්

### වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

කොළඹ 07, බාන්ස් පෙදෙස, අංක 10 දරන ස්ථානයේ පිහිටා ඇති Metalurgical Corporation of China Limited (MCC) (මෙටලජිකල් කෝපරේෂන් ඔෆ් චයිනා ලිමිටඩ්) නමැති සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC/96/2023/CO.
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම

රූයිටයි කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(RUITAI Construction (Pvt) Limited),
අංක 108/5A,
රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

*සහ*

අංක 205, අගලවත්ත පාර, මතුගම.

........................ *පෙත්සම්කරු.*

ඉහත නම සඳහන් සමාගම, කොළඹ වානිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ පෙත්සමක් එම අධිකරණය වෙත **වර්ෂ 2024 ක් වූ ජනවාරි මස 05 වැනි දින දී**, අංක 108/5ඒ, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07 සහ අංක 205, අගලවත්ත පාර, මතුගම දරන ස්ථානයේ රූයිටයි කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් පිළිගන්වන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ. තවද එකී පෙත්සම අධිකරණය ඉදිරියේ **වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 26 වැනි දින** විභාග කිරීමට නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධයෙන් ආඥාවක් කිරීමට ආධාර කිරීමට හෝ විරුද්ධව කැමති ඒ සමාගමේ යම් ණයහිමියෙකු හෝ ආධාරකරුවකුට විභාග කරන අවස්ථාවේ දී පෞද්ගලිකව ම හෝ තනි නීති උපදේශක හෝ නීතිඥවරයා මාර්ගයෙන් ඒ සඳහා පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක්, එය ඉල්ලා සිටින එකී සමාගමේ යම් ණය හිමියෙකුට සහ ආධාරකරුවෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවීම මත පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ උපුල් දිසානායක,
අංක 391/3/4, වෙල්ල වීදිය, කොළඹ 12.

**සැලකිය යුතුයි :** ඒ පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පැමිණ සිටීමට අදහස් කරන යම් තැනැත්තෙකු ඉහත නම සඳහන් උපුල් දිසානායක වෙත එසේ පැමිණීමේ තම අදහස පිළිබඳ ලිඛිත දැන්වීමක් භාරදීම හෝ තැපැල් මගින් එවීම කළ යුතුයි. දැන්වීමෙහි ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය හෝ ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ප්‍රකාශ කරනු ලැබ, ඒ පුද්ගලයාගේ හෝ ව්‍යාපාර ආයතනයේ අත්සන හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයා (ඇතොත්) නීතිඥවරයාගේ අත්සන තිබිය යුතු අතර, එය භාරදීම හෝ තැපැල් කරන්නේ නම් **වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 25 වැනි දින සවස 6 ට පෙර** ඉහත නම් සඳහන් අයට ලැබෙන සේ එවිය යුතුය.

නීතිඥ උපුල් දිසානායක,
අංක 391/3/4, වේල්ල වීදිය, කොළඹ 12.

2024 මාර්තු මස 27 වැනි දින.

04-159

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.